මගේ අංකය :- JSC/SEC/CIR/2018

**<u>අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 415 / 2018.</u>**

**සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන්,**

**දිසා විනිශ්චයකාරවරුන්/අතිරේක දිසා විනිශ්චයකාරවරුන්,**

**මහේස්ත්‍රාත්වරුන්/අතිරේක මහේස්ත්‍රාත්වරුන්,**

**කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන්,**

**කම්කරු වන්දි කොමසාරිස් සහ අතිරේක කම්කරු වන්දි කොමසාරිස් වෙත,**

<u>මහාධිකරණ විනිශ්චයකාර සහ ශ්‍රී ලංකා අධිකරණ සේවයේ නිලධරයන් සඳහා වන වැටුප් ව්‍යුහය</u>

ශීර්ෂගත කරුණ සම්බන්ධයෙන් වන අධිකරණ අමාත්‍යාංශ ලේකම්ගේ අංක. MOJ/E09/JNSS/2018 හා 2018.02.23 දින දරණ ලිපිය හා ඒ සමඟ යොමු කරන ලද 2018.02.19 දිනැති කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක. 01/2018 හා බැඳේ.

02. 2016.08.30 දිනැති කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක 05/2016 හි සඳහන් විධිවිධාන යටතේ මහාධිකරණ විනිශ්චයකාර සහ ශ්‍රී ලංකා අධිකරණ සේවයේ නිලධරයන් සඳහා 2017.12.31 දිනට ක්‍රියාත්මක වූ වැටුප් පරිමාණයන් වෙනුවට කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක. 01/2018, උපලේඛන I හි සඳහන් නව වැටුප් පරිමාණයන් 2018.01.01 දින සිට ක්‍රියාත්මක කිරීමට 2018.01.09 දින පැවති ආමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇති බව එහි සඳහන් කර ඇත.

03. ඒ අනුව, අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 389 හා කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක 05/2016 අනුව වැටුප් ගෙවන ලද මහාධිකරණ විනිසුරු, අධිකරණ නිලධාරී, කම්කරු විනිශ්චය සභා සභාපති, කම්කරු වන්දි කොමසාරිස් සහ අතිරේක කම්කරු වන්දි කොමසාරිස් යන තනතුරු දරණ නිලධාරීන්ගේ වැටුප්, 2018.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් උපදෙස් අනුව ඇමුණුම I සහ ඇමුණුම II හි පියවර අනුගමනය කරමින් පියවරට පියවර තැබීමේ ක්‍රමය යටතේ පරිවර්තනය කල යුතුය.

**01.** **වැටුප් පරිවර්තනය**

2017.12.31 දිනට පැවති වැටුප් පරිමාණයන්හි සිට උපලේඛන I හි සඳහන් නව වැටුප් පරිමාණයන්ට වැටුප් පරිවර්තනය කිරීම පියවරට පියවර තැබීමේ ක්‍රමය යටතේ සිදු කල යුතුය. (2017.12.31 දිනට ලබමින් සිටි වැටුප අනුව 2018.01.01 දිනට අදාල වන වැටුප ඇමුණුම II ඇසුරින් හඳුනාගත යුතුය.)

**02.** **වැටුපෙහි ප්‍රතිශතයක් වශයෙන් ගෙවනු ලබන දීමනා**

වැටුපෙහි ප්‍රතිශතයක් වශයෙන් ගෙවනු ලබන මාසික විශ්‍රාම වැටුප් සහිත දීමනාව තත්කාලයේ පවතින මූලික වැටුපෙන් 50% ක් විය යුතුය.

**03.** **වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා දායක මුදල්**

වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා දායක මුදල් අයකිරීමේ ප්‍රතිශතය 7% ක් වශයෙන් තවදුරටත් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතු අතර මේ සඳහා උපලේඛන I හි සඳහන් මූලික වැටුප අදාළ කර ගත යුතුය.

**04.** **වැටුප් වර්ධක දිනය**

මෙම වැටුප් සංශෝධනය හේතුවෙන් වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවේ.

**05.** **වැටුප් පරිමාණයක උපරිමයෙන් ඔබ්බට වැටුප් වර්ධක ගෙවීම**

වැටුප් පරිමාණයක උපරිමයට පැමිණි නිලධරයන්ට ඔවුන් විශ්‍රාම යන දින තෙක් හෝ වෙනත් වැටුප් පරිමාණයක් අදාල වන වෙනත් තනතුරකට පත්වන / උසස්වන තුරු තවදුරටත් වැටුප් වර්ධක ලබා දිය හැකිය. මෙහිලා වැටුප් පරිමාණයක උපරිමය යන්නෙන් අදහස් කෙරෙන්නේ JS-1-2-2016, JS-1-3-2016, JS-1-4-2016, JS-1-5-2016 සහ JS-2-2016 යන වැටුප් පරිමාණ අතරින් යම් වැටුප් පරිමාණයක උපරිම වැටුප් පියවර වේ.

**06.** **සංයුක්ත දීමනාව**

ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි සංයුක්ත දීමනා ගෙවීම සිදුකළ යුතුය.

**07. පොදු උපදෙස්**

මෙම චක්‍රලේඛය අනුව නිලධරයෙකුට 2018.01.01 දිනට හිමි විය යුතු වැටුප තීරණය කිරීමේ දී 2006.01.01 දින හෝ එදිනට පසුව සිදු කළ වැටුප් සංශෝධන අනුව වැටුප් සැකසීම සහ නිලධරයාට අදාල වැටුප් පරිවර්තන නිවැරදිව සිදු කර ඇති බවට අදාල බලධරයන් තහවුරු කර ගත යුතුය.

**08. වැඩිපුර ගෙවීම්**

මෙම උපදෙස් වැරදි ලෙස නිර්වචනය කිරීම හේතුවෙන් හෝ ලියවිලිවල වැරදීමක් හේතුවෙන් හෝ ගණනය කිරීමේදී ඇතිවන වැරදීමක් හේතුවෙන් හෝ වෙනත් වැරදීමක් හේතුවෙන් හෝ කිසියම් නිලධරයෙකුට වැඩිපුර මුදලක් ගෙවා ඇත්නම් එවැනි වැඩිපුර ගෙවා ඇති මුදල් ආපසු ගෙවීමට එම නිලධරයා බැඳී සිටී.

**09. පැහැදිලි කර ගැනීම් හා වැඩිදුර උපදෙස්**

මෙම චක්‍රලේඛයේ විධිවිධාන පිළිබඳව පැහැදිලි කිරීම් හා වැඩිදුර උපදෙස් අපේක්ෂා කරන්නේ නම් එවැනි ඉල්ලීම්, ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව, කොළඹ 12 වෙත යොමු කල යුතුය.

එච්.එස්.සෝමරත්න

ලේකම්

අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2018 මාර්තු මස 16 වෙනි දින,

කොළඹ 12,

අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේදී ය.

| සේවා ගණය | | | | ශ්‍රී ලංකා අධිකරණ සේවය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Service Category | | | | Sri Lanka Judicial Service | | | | | | | |
| වැටුප් කේත අංකය | | | ජේ.එස්. 1-1 - 2016 | | ජේ.එස්. 1-2 - 2016 | | ජේ.එස්. 1-3 - 2016 | | ජේ.එස්. 1-4 - 2016 | | ජේ.එස්. 1-5 - 2016 |
| Salary Code | | | JS 1-1-2016 | | JS 1-2-2016 | | JS 1-3-2016 | | JS 1-4-2016 | | JS 1-5-2016 |
| 1 | 2 | 3 | 4 | 3 | 4 | 3 | 4 | 3 | 4 | 3 | 4 |
| | | | 1,335 | | 1,630 | | 2,170 | | 2,350 | | 2,500 |
| | | | 5 | | 10 | | 10 | | 10 | | 10 |
| | | | 1,630 | | | | | | | | |
| | | | 5 | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| 1 | | II-II | 62,335 | II-I | 75,000 | I-II | 86,500 | I-I | 100,000 | SPL | 110,000 |
| 2 | | | 63,670 | | 76,630 | | 88,670 | | 102,350 | | 112,500 |
| 3 | | | 65,005 | | 78,260 | | 90,840 | | 104,700 | | 115,000 |
| 4 | | | 66,340 | | 79,890 | | 93,010 | | 107,050 | | 117,500 |
| 5 | | | 67,675 | | 81,520 | | 95,180 | | 109,400 | | 120,000 |
| 6 | | | 69,010 | | 83,150 | | 97,350 | | 111,750 | | 122,500 |
| 7 | | | 70,640 | | 84,780 | | 99,520 | | 114,100 | | 125,000 |
| 8 | | | 72,270 | | 86,410 | | 101,690 | | 116,450 | | 127,500 |
| 9 | | | 73,900 | | 88,040 | | 103,860 | | 118,800 | | 130,000 |
| 10 | | | 75,530 | | 89,670 | | 106,030 | | 121,150 | | 132,500 |
| 11 | | | 77,160 | | 91,300 | | 108,200 | | 123,500 | | 135,000 |

II – II : II පන්තිය II ශ්‍රේණිය/ Class II Grade II

II – I : II පන්තිය I ශ්‍රේණිය/ Class II Grade I/ කම්කරු විනිශ්චය සභා සභාපති II ශ්‍රේණිය / president Labour Tribunal Grade II/ නියෝජ්‍ය කම්කරු වන්දි කොමසාරිස්/ Deputy Commissioner for Wokmen's Compensation

I – II: I පන්තිය II ශ්‍රේණිය/ Class I Grade II

I-I : I පන්තිය I ශ්‍රේණිය/ Class I Grade I/ කම්කරු විනිශ්චය සභා සභාපති I ශ්‍රේණිය/ President, Labour Tribunal Grade I/කම්කරු වන්දි කොමසාරිස්/ Commissioner for Wokmen's Compensation

SPL : විශේෂ ශ්‍රේණිය/ Special Grade

ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව

| සේවා ශ්‍රේණිය | | | මහාධිකරණ විනිසුරුවරුන් |
|---|---|---|---|
| Service Category | | | High Court Judges |
| වැටුප් කේත අංකය | | | ජේ.එස්. 2 - 2016 |
| Salary Code | | | JS 2-2016 |
| 1 | 2 | 3 | 4 |
| | | | 2,750 |
| | | | 10 |
| | | | |
| | | | |
| 1 | | | 120,000 |
| 2 | | | 122,750 |
| 3 | | | 125,500 |
| 4 | | | 128,250 |
| 5 | | | 131,000 |
| 6 | | | 133,750 |
| 7 | | | 136,500 |
| 8 | | | 139,250 |
| 9 | | | 142,000 |
| 10 | | | 144,750 |
| 11 | | | 147,500 |

ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව

**ඇමුණුම I**

| සේවා ගණය | වැටුප් කේතය | වැටුප් පරිමාණය |
|---|---|---|
| අධිකරණ නිලධාරී **(II පන්තිය I ශ්‍රේණිය)**<br>කම්කරු විනිශ්වය සභා සභාපති **(II ශ්‍රේණිය)**<br>නියෝජ්‍ය කම්කරු වන්දි කොමසාරිස් | JS 1-2-2016 | 75000-10 x 1630 - 91300 |
| අධිකරණ නිලධාරී **(I පන්තිය II ශ්‍රේණිය)** | JS 1-3-2016 | 86500-10 x 2170 - 108200 |
| අධිකරණ නිලධාරී **(I පන්තිය I ශ්‍රේණිය)**<br>කම්කරු විනිශ්වය සභා සභාපති **(I ශ්‍රේණිය)**<br>කම්කරු වන්දි කොමසාරිස් | JS 1-4-2016 | 100000-10 x 2350 - 123500 |
| අධිකරණ නිලධාරී **(විශේෂ ශ්‍රේණිය)**<br>කම්කරු විනිශ්වය සභා සභාපති **(විශේෂ ශ්‍රේණිය)** | JS 1-5-2016 | 110000-10 x 2500 - 135000 |

| සේවා ගණය | වැටුප් කේතය | වැටුප් පරිමාණය |
|---|---|---|
| මහාධිකරණ විනිසුරු | JS 2-2016 | 120000-10 x 2750 - 147500 |

**ඇමුණුම II**

| අධිකරණ නිලධාරී (II පන්තිය I ශ්‍රේණිය)<br>කම්කරු විනිශ්චය සභා සභාපති (II ශ්‍රේණිය)<br>නියෝජ්‍ය කම්කරු වන්දි කොමසාරිස් | | | |
|---|---|---|---|
| | **JS – 1 - 2016** | | **JS – 1 – 2 - 2016** |
| 9 | 71,195 | 1 | 75,000 |
| 10 | 72,825 | 2 | 76,630 |
| 11 | 74,455 | 3 | 78,260 |
| 12 | 76,085 | 4 | 79,890 |
| 13 | 77,715 | 5 | 81,520 |
| 14 | 79,345 | 6 | 83,150 |
| 15 | 80,975 | 7 | 84,780 |
| | | 8 | 86,410 |
| | | 9 | 88,040 |
| | | 10 | 89,670 |
| | | 11 | 91,300 |
| | | | |

| අධිකරණ නිලධාරී (I පන්තිය II ශ්‍රේණිය) | | | |
|---|---|---|---|
| | **JS – 1 - 2016** | | **JS – 1 – 3 - 2016** |
| 16 | 82,605 | 1 | 86,500 |
| 17 | 84,775 | 2 | 88,670 |
| 18 | 86,945 | 3 | 90,840 |
| 19 | 89,115 | 4 | 93,010 |
| 20 | 91,285 | 5 | 95,180 |
| 21 | 93,455 | 6 | 97,350 |
| | | 7 | 99,520 |
| | | 8 | 101,690 |
| | | 9 | 103,860 |
| | | 10 | 106,030 |
| | | 11 | 108,200 |
| | | | |

**අධිකරණ නිලධාරී (I පන්තිය I ශ්‍රේණිය)**

**කම්කරු විනිශ්චය සභා සභාපති (I ශ්‍රේණිය)**

**කම්කරු වන්දි කොමසාරිස්**

| | JS – 1 - 2016 | | JS – 1 – 4 - 2016 |
|---|---|---|---|
| 22 | 95,625 | 1 | 100,000 |
| 23 | 97,795 | 2 | 102,350 |
| 24 | 99,965 | 3 | 104,700 |
| 25 | 102,135 | 4 | 107,050 |
| | | 5 | 109,400 |
| | | 6 | 111,750 |
| | | 7 | 114,100 |
| | | 8 | 116,450 |
| | | 9 | 118,800 |
| | | 10 | 121,150 |
| | | 11 | 123,500 |

**අධිකරණ නිලධාරී ( විශේෂ ශ්‍රේණිය)**

**කම්කරු විනිශ්චය සභා සභාපති ( විශේෂ ශ්‍රේණිය),**

| | JS – 1 - 2016 | | JS – 1 – 5 - 2016 |
|---|---|---|---|
| 26 | 104,305 | 1 | 110,000 |
| 27 | 106,475 | 2 | 112,500 |
| 28 | 108,645 | 3 | 115,000 |
| 29 | 110,815 | 4 | 117,500 |
| | | 5 | 120,000 |
| | | 6 | 122,500 |
| | | 7 | 125,000 |
| | | 8 | 127,500 |
| | | 9 | 130,000 |
| | | 10 | 132,500 |
| | | 11 | 135,000 |

| මහාධිකරණ විනිශ්චයකාරවරු | | | |
|---|---|---|---|
| | JS – 2 - 2016 | | JS – 2 - 2016 |
| 1 | 112,450 | 1 | 120,000 |
| 2 | 115,200 | 2 | 122,750 |
| 3 | 117,950 | 3 | 125,500 |
| 4 | 120,700 | 4 | 128,250 |
| 5 | 123,450 | 5 | 131,000 |
| 6 | 126,200 | 6 | 133,750 |
| | | 7 | 136,500 |
| | | 8 | 139,250 |
| | | 9 | 142,000 |
| | | 10 | 144,750 |
| | | 11 | 147,500 |